# බොරුවෙන් කේළමින් වැළකී පණුවන් පිරුණු ගඳ ගසන කටක් ඇති ප්‍රේතයෙකු නොවන්න

## පූතිමුඛ ප්‍රේත වස්තුව ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, පෙතවත්ථුපාළි, උරග වර්ගය - පිටු 4 - 5)

නාරද තෙරණුවෝ අහසෙහි ඉන්නා දෙවියෙකුගේ සිරුරකට සමාන සුන්දර සිරුරක් ඇති, නමුත් ඉතා ම දුගඳ පණුවන් පිරුණු කටක් ඇති ප්‍රේතයෙකු දුටුවා. එයට හේතුව ප්‍රේතයාගෙන් ඇසූ ස්වාමීන් වහන්සේට ප්‍රේතයා මෙසේ උත්තර දුන්නා.

"මා පෙර ආත්මයක පවිටු භික්ෂුවක් ව සිටියා. වචනයෙන් සංවර වුණේ නැහැ. බඹසර රැකපු නිසා ශරීරය ශෝභාවත් වුණා. එහෙත් බොරු කීම සහ කේළාම් කීම නිසා මෙවැනි කටක් ලැබුණා".